08 වන පිටෙන්

සම කල හැක්කේ කුමක්ද? සෙනෙහස වැඩ්දා සිතද බොළඳ වේ..... ලොවම ආදරෙයි කියා සිතේ...මායාවක් වී එහි තනි වූ දා...අම්මා පමණයි ළඟ ඉන්-න්....මෙයටත් වඩා සදාතනික සත්‍යයක් තවත් තිබේද? එසේම ඒ ගීතයේම එතුමා ලියා ඇති  දරුවන්ගේ දුක් කඳුළු දකින දා සුරලොව සිට අත පා ඒ කඳුලැලි පිසිනා... හදවත කිරි ගැහෙනවා නේද? එපමණක්ද පියා ගැන ඔහු ලියූ
මහ මෙර වැනි බර සිතින් උසුලනා.....
කඳුලැලි සමුදුර නෙතින් සඟවනා.....
දරු දුක උහුලා තනිව වැලපෙනා....
බුදු බව ලබනා පියවරු වෙසෙනා...
පූජා...පූජා වේවා....

ගීතයේ පද අපට ඒ බර හදවතට ධනවනවා නොවේද? පියකුගේ, මවකගේ දාරක ප්‍රේමය ඉස්මතු කිරීමට මීටත් වඩා හොඳ වචන හා උපමා උපමේය තවත් ඇතිදැයි මට නම් සිතා ගත නොහැකිය.

ගාල්ලේ වඳුරඹ නම්වූ සුන්දර ගම්මානයේ ජන්ම ලාභය ලැබූ ගමගේ සූරීන් 1955 වසරේදී එතුමන්ගේ ප්‍රථම ගේය පද රචනාව, ජී එස් බී රානි පෙරේරා මහත්මියට ලියා දුන්නේය. එහෙත් 1960 වසරේදී එතුමන්ට හමුවූ ප්‍රේමසිරි කේමදාසයන් ගමගේ සූරීන්ගේ ගීත ලිවීමේ ආශාව තව තවත් වැඩි කිරීමට සමත් වීම එතුමාගේ කළා දිවියේ සංධිස්ථානය විය. මේ අතර 1962 දෛවෝපගත සිදුවීමක් ලෙස කේ ඒ ඩබ්ලිව් පෙරේරා සූරීන් තමන්ගේ ප්‍රථම සිනමා පටය වූ සැනසුම කොතනද චිත්‍රපටයේ ගීත රචකයා ලෙස එවකට ආධුනික මට්ටමේ වුන් ගමගේ සූරීන්වද සංගීත අධ්‍යක්ෂක ලෙස ප්‍රේමසිරි කේමදාසයන්වද තෝරාගැනීම ගමගේ සූරීන්ගේ කළා දිවිය උඩු යටිකුරු කළ අහඹු සිදුවීම විය. එයින්ම අතිවිශිෂ්ට සිනමා ගීත රචකයකුගේ උපත සිදුවීම කලාවට ළැඳි අප සැමගේම පිනක් බව මම අදහමි. ඒ සඳහා මඟ විවර කළ කේ ඒ ඩබ්ලිව් පෙරේරා නම්වූ ඒ අසහාය සිනමා අධ්‍යක්ෂකවරයාද මම මේ අවසථාවේ ඉතාමත්ම ගෞරවපූර්වකව සිහිපත් කරමි.

කිසි විටෙක තම මුල අමතක නොකළ ගමගේ සූරීන් හැමවිටම තම සිනමා ගීත කලාවට අත්වැල සැපයූ කේ ඒ ඩබ්ලිව් පෙරේරා සූරීන් ගැන කෘතවේදීව සඳහන් කිරීමට අමතක නොකළේය. එතුමාගේ සුළං කුරුල්ලෝ ගීත නිබන්ධ සංග්‍රහය කේ ඒ ඩබ්ලිව් ශ්‍රී නාමයට පුදකළේ එහෙයිනි. එය මෙසේයි.

## පිදුම

**චිත්‍රපට ගීත ක්ෂේත්‍රයට මා යොමු කළ**
**කේ ඒ ඩබ්ලිව් පෙරේරා මහත්මාට**
**දුහුණනට සිත නොදෙන සමයෙක**
**ඔබ ළබැඳි සිත පෑ අතින්**
**මෙතෙක් දුර ආ ගමන සිහිකර**
**අත්වැලක් ලැබ ඔබ වෙතින්**
**දුහුණනට අද මුණ ගැසේවා**
**මෙවන් තුඟු මිනිසුන් නිතින්**
**එවන් පැතුමෙන් මහරු ගුණයට**
**පුදමි මේ ගත බැති සිතින්**

**මින් වසර දහතුනකට පෙරදී ගමගේ සූරීන් අප හැර ගියද එතුමන්ගේ ගුණ කඳ හා ලියූ අමරණීය ගී අදටත් ජීවමානය. එතුමන්ගේ සුළං කුරුල්ලෝ කෘතියට පසු වදන**
**ලියූ මහචාර්ය එදිරිවීර සරචන්ද්‍රයන්ගේ සටහනක් උපුටා දක්වමින් ධර්මසිරි ගමගේ නම්වූ ඒ විසල් තුංඟ මිනිසා ගැන තැබූ මගේ කුඳු සටහන මෙසේ අවසන් කරමි.**

**කුසලතා පිරිපුන් සාහිත්‍යවේදියෙකුවූ ධර්මසිරි ගමගේ මෙතෙක් කලක් ප්‍රමාද වී හෝ මේ අන්දමේ ගීත සංග්‍රහයක් පළ කිරීම අතිශයින්ම වැදගත්ය.**

**ගීත රචනා ක්ෂේත්‍රයේ දීර්ඝ කාලයක් නිරත වී සාර්ථක ගී විශාල සංඛ්‍යාවක් රචනා කළ ඔහුගේ මෙම ගීත සම්මුචය එම ක්ෂේත්‍රයේ වැදගත් මං සලකුණක් වනු නිරනුමාණය. නවක නිර්මාණ ශිල්පීන්ට ගමගේ පෑ අත්වැල ලෙසින්ම මතු පරපුරේ ගීත රචකයනට, සුළං කුරුල්ලෝල ගීත සංග්‍රහය වැඩදායක අත්වැලත් වනු නිසැකය.**






**සන්නස ගැන ඔබේ අදහස් අපට ලියන්න.**

Sannasa, Suite 504, 530 Little Collins Street, Melbourne 3000

Via Sannasa Website:
Visit www.sannasa.com.au

